# ගුණ නැණ බෙලෙන් යුතු මිනිසුන් බිහි කළ අපේ ධර්ම සාහිත්‍යය

මෙල්බර්න්,
රොක්බෑන්ක්හි
පාරමිතා බෞද්ධ
විහාරවාසී
ඉඳිපරපේ
ධම්මසිරි හිමි



අනුබුදු මිහිඳු සමිඳුන්ගේ ලංකාගමනයෙන් ඔප-වැටුණු ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ජීවය බුදුදහමයි. විධිමත් භාෂා ව්‍යවහාරයක් හෝ දියුණු සාහිත්‍යයක් නොතිබුණු ලාංකීය සමාජය, මහාවිහාරය මුල්කොට ඇරඹුණු බෞද්ධාගමික, අධ්‍යාපනික, සංස්කෘතික සහ සාහිත්‍යයික නවෝදය නිසා උත්කෘෂ්ට ජාතියක් බවට පත්විය. විශේෂයෙන් බණකතා සාහිත්‍යය අප පැරැන්නන්ගේ චරිත සංවර්ධනයට බෙහෙවින් ම ඉවහල් විය. ලියන්නට, කියවන්නට නොදත් අය පවා හොඳ - නරක, පින් - පව්, කුසල - අකුසල මොනවාදැයි ඇසීම් මාත්‍රයෙන් දැනගෙන සිටියේ බණකතාවන් මගිනි. විශේෂයෙන් අට්ඨකථාවන් ලියූ වියත් යතිවරුන්ගේ මහත් පරිශ්‍රමය නිසා සිංහල සාහිත්‍යයට ලැබුණු අනර්ඝ නිර්මාණයන් සියවස් විසිහයකට පසුවත් කිසිදු අඩුවකින් තොර ව ඇගයීමට ලක්වන්නේ ඒවා එතරම් ම විශිෂ්ට ලෙස මිනිසත්කම මත පදනම් ව රචනා වූ නිසාය.  මිනිසා සතු ව සහජයෙන් ම ඇති ප්‍රබලතා මෙන් ම දුර්වලතා බුදුවදන් ඇසුරින් පැහැදිලි කර දී ඒ දුර්වලතා මග හරවාගෙන ප්‍රබල ආධ්‍යාත්මික ශක්තියකින් යුත් මනසක් ඇති, ගුණවත් බවින් පිරුණු, බුද්ධිමත්, ශ්‍රේෂ්ඨ, චරිතවත් පුද්ගලයන්ගෙන් සැදුම් ලත් සමාජයක් ගොඩනැගුණේත්, පැවතුණේත් අපේ ධර්මසාහිත්‍යය එකල සමාජයේ පරමාදර්ශය වූ නිසාවෙනි.

එහෙත් අවාසනාවකට වත්මන් සමාජයෙන් මේ අගනා ධර්ම සාහිත්‍යය ඈත්වෙමින් පවතියි. විශේෂයෙන් අපේ ළමා සහ තරුණ පරපුර ධර්මසාහිත්‍යයෙන් ඈත්කිරීමට රූපවාහිනිය සහ පරිගණකය වැඩි දයකත්වයක් සපයයි. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ වාසය කරන සහ විදේශවල වාසය කරන දරුවන් නිර්මාණාත්මක බවින් තොර යාන්ත්‍රිකකරණයට ලක්වෙමින් පවතියි. ස්වභාව සෞන්දර්යයෙන්  සිත් තුළ නැගෙන චමත්කාරජනක සිතුවිලි කවියකට, ගීතයකට හෝ වෙනත් කලා නිර්මාණයකට නැගිය හැකි හෝ ඒවා රසවිඳින්නට සමත් සාහිත්‍ය රසකාමීන් වත්මන් අධ්‍යාපන රටාවෙන් බිහි නොවෙයි. විද්‍යාවේ දියුණුවත් සමග සියල්ල දෙස භෞතික දෘෂ්ටියකින් බැලීමට දරුවන් හුරු වී ඇත.  මේ කණගාටුදයක තත්ත්වය සිංහල ගීත සාහිත්‍යයේ යතිවර සලකුණ - අපේ රඹුකන සිද්ධාර්ථ හිමියන් සිය කවිබසින් පළ කළේ මෙහෙමයි.

ඉර හඳ දෙයියො කියා කිව්ව මිනිස්සු
අව්වැසි දුන්න කියා වැන්ද මිනිස්සු
ලෝකෙ දියුණු නැති කාලේ එහෙම කළාලු
ඒත් අනේ සන්තෝසෙන් කල් ගෙව්වාලු

ඉර හඳ දෙයියො කියා දැන් කියන්නෙ නෑ
අව්වැසි දුන්න කියා දැන් වඳින්නෙ නෑ
ලෝකෙ දියුණුලු ඉර හඳ දෙයියො නෙවෙයිලු
ඒත් අනේ සන්තෝසය පළා ගිහින්ලු

දියුණු ලෝකෙ මිනිස්සුන්ට සැප සම්පත් වින කරනව
තණ්හාවේ ඇලී ගැලී තුන්තිස්පැය ගෙවී යනව
අපි දියුණුයි අපි දියුණුයි කියා ඔහේ හඬ තලනව
සන්තෝසය ළඟා වෙන්න බැරි ඈතක පින් පුරනව

(ගායනය විශාරද මාලනී බුලත්සිංහල මහත්මිය)

අප පෙන්වා දීමට උත්සාහ කරන්නේ මිනිසත් බවින් පිරිපුන් ගුණවත් මිනිසුන් වෙසෙන සමාජයක් තනන්නට සාහිත්‍යයට විශේෂයෙන් ආගමික සාහිත්‍යයට ඇති හැකියාවත්, ඉන් ප්‍රයෝජන නොගැනීම නිසා බිඳ වැටෙන මානව සම්බන්ධතා යළි ගොඩ නැගීමට මග පෙන්වා දීමටත්ය. තවත් සරල ව කිවහොත් පූර්ණ පෞරුෂ සහ චරිත සංවර්ධනයක් සඳහා ධර්ම සාහිත්‍ය රස විඳ ගැනීමට සමත් සහෘද පිරිසක් අපේ අනාගත පරපුර තුළින් බිහි කිරීමට උනන්දු කරවීමයි. අපේ ධර්ම සාහිත්‍යයෙන් ජීවන දැක්ම පමණක් නොව ආධ්‍යාත්මික පෝෂණය ද නොඅඩු ව ලැබිණි. සාර්ථක ජීවිතයක අවසන සැනසිලිදායක ව මරණයට මුහුණ දීමට අපේ පැරැන්නන් සිත ශක්තිමත් කරගත්තේ ධර්ම සාහිත්‍යයෙන් ඔවුන් ලද මග පෙන්වීම නිසාය. එහෙයින් යහපත්, සැනසිලිදායක, නිවුණු දිවි පැවැත්මක් අපේක්ෂා කරන කවරෙකු විසින් වුව ද ධර්ම සාහිත්‍යයේ රසගුණ විඳගත යුතුය.

"යමෙක් නිරන්තර කාව්‍යසේවනයෙන් ලබන ලද අභ්‍යාසය හා ජීවිත පරිඥානය කරණ කොට ගෙන විශද වූ ස්වකීය මනස් කැඩපතෙහි වෙනත් කාව්‍ය නාට්‍යාදී වර්ණිතයන් අනුශීලනය කරන කල්හි එම පූර්ව ආස්වාදන පිළිබිඹුව සමග සැසඳෙමින් තත් කවියාගේ හදවත සමග සංවාදගත විය හැකි නම් ඔවුහු සහෘදයෝ වෙති." සංස්කෘත කාව්‍ය විචාරකයෙකු වූ අභිනවගුප්තයන් සිය ධ්වන්‍යාලෝක නම් ග්‍රන්ථයේ 'සහෘදයා' හඳුන්වා දුන්නේ ඒ ආකාරයටය.



'සාහිත්‍යය' යන වචනයට විවිධ භාෂා සම්ප්‍රදායයන්හි සපයා ඇති නිර්වචනයන් බොහෝ දුරට සමානය.

සහිතස්‍ය භාවං සාහිත්‍යං (සංස්කෘත)
සහිතස්ස භාවං  සාහිතං  (පාලි)
සහෘදවත් බව සාහිත්‍යයයි (සිංහල)
Pieces of writing that are valued as works of arts, especially novels, plays and poems. (Oxford Dictionary)

'කවිය' යනු රසවත් වැකියයි. (වාක්‍යං රසාත්මකං කාව්‍යං) කවියා, සාහිත්‍යකරුවා තමා දකින දෙය රසවත් භාෂාවක් යොදා ගනිමින් අපූර්වාකාරයෙන් ඉදිරිපත් කරන විට එය තමාගේ ම අත්දැකීමක් ලෙස යමෙකුට හැඟෙන්නේ නම් එය සහෘද බවක් හෙවත් හදවත් අතර සමානත්වයක් ඇති කරයි. අභිනවගුප්තයන්ගේ ප්‍රකාශනයට අනුව කවියාගේ නැතහොත් නිර්මාණකරුවාගේ අදහස හඳුනා ගැනීමට සහෘදයා සමත් විය යුතුය.

39 වන පිටට

